# තපුරුකමට පාඩමක්



පි. ඩී. අයි. සමන්ති



නපුරුකමට පාඩමක්

පි. ඩි. අයි. සමන්ති

කතෘ ප්‍රකාශනයකි.

ප්‍රථම මුද්‍රණය : 2026 ජූනි

ISBN 978–624 -208- 903- 4

කතෘ : පි. ඩි. අයි. සමන්ති

පරිගණක අක්ෂර හා
පරිගණක චිත්‍ර නිර්මාණය : ෂලෝමී පෙරේරා මිය.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍යා දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10


# පිදුම

අද මා ළඟ නොසිටියත්, මගේ ජීවිතේ හැම අවස්ථාවකදීම මා
ළඟින් සිට මා දිරිගන්වමින් මට  උපකාර කල, මගේ ආදර ස්වාමියා
සිහිපත් කරමින්, මගේ සෙවනැල්ල මෙන් සිටින මගේ ආදර
දරු තිදෙනාටත්, සදාදර ලේලිය ෂලෝමි දියණියටත්
පුදමි මෙය ආදරයෙන්.

# ස්තුතිය

මෙම අවස්ථාව මට ලබාදුන් තුෂාරි නැගණියටත්, මෙම කතාව
අකුරු කර හා තම චිත්‍ර පරිගණක චිත්‍ර බවට පත් කරමින්
අලංකාරවත් කරදුන් මගේ සදාදර ලේලිය ෂලෝමි දියණියටත්,
ආදර ලොකු පුතාටත් මගේ හදපිරි ස්තුතිය පිරි නමමි.


නපුරුකමට
පාඩමක්.



එක දවසක් අහස නිල් රෙද්දක් එළලා වගේ හරිම ලස්සනට බැබළි බැබළි තිබුණා.මේ ලස්සන නිල් අහසේ, වලාකුළු දෙකක් එහාට මෙහාට පා වෙවී හිටියා.



එක වලාකුළක් අළු පාටට අඳුරු වෙලා කැත වෙලා හිටියේ. එයා වැහි වලාකුළක්.අනිත් එක්කෙනා පුලුන් ගොඩක් වගේ සුදට සුදේ ලස්සනට හිටියා. එයා හරිම ආඩම්බර වලාකුළක්.



සුදු වලාකුළ, වැහි වලාකුළට හිනහා වෙන්න ගත්තා.

" අපෝ..... ඔයාගේ හැටි. පාටත් අඩු වෙලා, කැතත්..... බෑ " කියලා සුදු වලාකුළ අඳුරු වලාකුළට කිව්වා.

එහෙම කියපු සුදු වලාකුළ ආඩම්බරයෙන් තව තවත් පුලුන් ගොඩක් වගේ පිම්බුණා.

අඳුරු වලාකුළට සුදු වලාකුළ කියපු දේ නිසා, ගොඩක් දුක හිතුණා. එයාට ඇඬෙන්න ආවා.



මේ කතාව අහගෙන හිටිය ඉර මාමටත් ගොඩක් දුක හිතිලා, එයත් ටික ටික හැංගෙන්න ගත්තා.

අනේ.... ඉතින් දුකින් හිටිය අඳුරු වලාකුළ එක පාරටම හයියෙන් අඬන්න ගත්තා.

දැන් අඳුරු වලාකුළ හොඳටම අඬනවා.



මේ හැමදේම බලාගෙන හිටියා එක්කෙනෙක්. ඒ තමයි හුළං නැන්දා.හුළං නැන්දටත් දුකයි වගේම තරහයි.

සුදු වලාකුළගේ ආඩම්බරකම නැති කරලා දාන්න ඕන කියලා හුළං නැන්දා හිතුවා.



එහෙම හිතපු හුළං නැන්දා, එක පාරටම හයියෙන් හුළං පිඹින්න ගත්තා.

දැන් අඳුරු වලාකුළ අඬනවා, හුළං නැන්දා හුළං පිඹිනවා.



අනේ....පුලුන් රොදක් වගේ හිටිය අර ලස්සන ආඩම්බර වලාකුළ හුළං සැරට කැඩිලා විසිරිලා, පුංචි පුංචි වලාකුලු ගොඩක් වුණා.හුළං නැන්දා තව තවත් හුළං පිඹින්න ගත්තා.



අනේ ඉතින් අන්තිමට අර පුංචි වලාකුලු ඈතට ඈතට පාවෙලා ගිහින් නොපෙනීම ගියා.

අර අඳුරු වලාකුළ අයෙත් ලස්සනම ලස්සන වලාකුළක් වෙලා, අහසේ පාවෙන්න ගත්තා. ඉර මාමත් ආයෙත් සතුටින් එළියට ආවා.

දැන් අහස ආයෙත් ලස්සනම ලස්සනට බැබලෙන්න ගත්තා.



ඉතින් පුතේ, අපිත් කාටවත් නපුරු නොවී, බොරු ආඩම්බරයක් පෙන්වන්නේ නැතුව, කාගේවත් හිත රිද්දන්නේ නැතුව, හැමෝමත් එක්ක ආදරයෙන් කතා කරන්න, එකමුතුකමින් ජීවත් වෙන්න පුරුදු වෙන්න ඕන.

එතකොට තමයි අපි හොඳ දරුවෝ වෙන්නේ. එතකොට පුංචි ඔයත්, හැමදාම අර නිල් අහස වගේ ලස්සනට බැබලෙන්න ගන්නවා.අපේ පුංචි ලෝකය තව තවත් ලස්සන වෙනවා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්නමගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ගා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්ථ වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)